
නිදහස් මාධ්‍ය ව්‍යාපාරය
சுதந்திர ஊடக இயக்கம்
FMM SRI LANKA Free Media Movement

# මාධ්‍ය නිදහසඃ නිරීක්ෂණ වාර්තාව
## ஊடக சுதந்திரம்: கண்காணிப்பு அறிக்கை
## Media Freedom Rights Monitoring Report

MFRMD

2023 පෙබරවාරි
3 වන වෙළුම - කලාප අංක 02


නිදහස සත්‍යග්‍රහයට ප්‍රහාරයක්!


වසන්තගේ නිදහසට එරෙහි අභියාචනයක්


කඳුළු ගෑස් ප්‍රහාරයෙන් උද්ඝෝෂකයෙක් මියයයි

මාධ්‍ය නිදහසට අදාළව ඒ ඒ මාසය තුළ වාර්තා වන සිදුවීම්, පූර්ව සිදුවීම්වල වර්ධනයන් හා ඒවාට අදාළ නිරීක්ෂණ මෙම වාර්තාවට ඇතුළත් වේ. මාධ්‍යවේදීන්ගේ මෙන්ම ජනතාවගේ භාෂණයේ හා අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය සම්බන්ධ සිදුවීම්, නව නීති පැනවීම්, නීති ප්‍රතිසංස්කරණ සහ අදාළ ප්‍රස්තුතයන් පිළිබඳව ජාතික හා ජාත්‍යන්තර වශයෙන් පළ වන ප්‍රතිචාර යනාදිය කෙරෙහිද මෙහිදී අවධානය යොමු කෙරේ. මාධ්‍ය නිදහස පිළිබඳව නිරීක්ෂණය කිරීම සඳහා නිදහස් මාධ්‍ය ව්‍යාපාරය උපයෝගී කර ගන්නා විෂය පථයට/ සංරචකයන්ට අදාළ සිදුවීම් 14ක් 2023 පෙබරවාරි මාසයේදී නිරීක්ෂණය විය. ආරක්ෂාව හා සුරක්ෂිතබව යන සංරචකයට අයත් සිදුවීම් 4ක්, නීතිමය කොන්දේසි යන සංරචකය යටතට ගැනෙන සිදුවීම් 9ක් සහ වෘත්තීයවේදිත්වය යන සංරචකයට අදාළ එක් සිදුවීමක් ඒ අතර වෙයි.

## නිරීක්ෂණය වූ සිදුවීම්

1. නම් කළ ක්‍රියාකාරිකයින් පිරිසකට ජාතික නිදහස් උත්සවය පැවැත්වෙන ප්‍රදේශයට ඇතුළුවීම තහනම් කරමින් අධිකරණ නියෝගයක් නිකුත් කිරීම.
2. එල්ෆින්ස්ටන් රඟහල අසල පැවති නිදහස සත්‍යග්‍රහයට පොලිසිය පහරදී විසුරුවාහැරීම.
3. නිදහස සත්‍යග්‍රහයේදී අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කළ ක්‍රියාකාරිකයින් සිව් දෙනෙකුට ඇප නියම වීම.
4. අන්තර් විශ්වවිද්‍යාල ශිෂ්‍ය බල මණ්ඩලයේ කැඳවුම්කරු වසන්ත මුදලිගේ නිදහස් කිරීමට එරෙහිව අභියාචනයක් ඉදිරිපත් කිරීමට පොලිසිය තීරණය කිරීම.
5. කැලණිය විශ්වවිද්‍යාලයේ සිසු නායකයින්ට එරෙහිව පොලිසිය ඉදිරිපත් කර ඇති චෝදනා පදනම් විරහිත බව විශ්වවිද්‍යාල පාලන අධිකාරිය අධිකරණයට දැනුම් දීම.
6. ජනපතිගේ යාපනය සංචාරයට එරෙහිව උද්ඝෝෂණයක නිරත වූ පා.ම. ගජේන්ද්‍රන් ඇතුළු විරෝධතාකරුවන් 18 දෙනෙකු අත්අඩංගුවට ගැනීම.

7. කොවිඩ් 19 කාලසීමාව තුළ ශ්‍රී ලංකා රජයේ විනිවිධභාවය හා වගවීම සම්බන්ධ විමර්ශනය කිරීම සඳහා මාධ්‍යවේදීන්ට පුහුණු වැඩසටහනක් පැවැත්වීම.

8. උද්ඝෝෂණවලට සහභාගී වීම වැළැක්වීම සඳහා පොලිසිය තමන්ට එරෙහිව කුමන්ත්‍රණකාරීව කටයුතු කරන බවට අතුරුදන්වූවන්ගේ ඥාතීන්ගේ සංගමයේ සභාපති මාරියුසුරේස් ඊශ්වරී මානව හිමිකම් කොමිසමට පැමිණිලි කිරීම.

9. පුවත් වෙබ් අඩවි ලියාපදිංචිය සම්බන්ධයෙන් මානව හිමිකම් කොමිසම නිර්දේශයක් නිකුත් කිරීම.

10. සමගි ජන බලවේගය විසින් කැඳවන ලද උද්ඝෝෂණයකට අදාළව අධිකරණයෙන් තහනම් නියෝගයක් නිකුත් කිරීම.

11. අධ්‍යාපන අමාත්‍යාංශයට බලහත්කාරයෙන් ඇතුළු වීමේ චෝදනාව මත අත්අඩංගුවට ගත් ශිෂ්‍ය භික්ෂූන් ඇතුළු සරසවි සිසුන් 62 දෙනෙකු බන්ධනාගාරගත කිරීම.

12. අධ්‍යාපන අමාත්‍යාංශය තුළදී පොලිසිය සිසුන්ට පහරදෙන අයුරු වීඩියෝගත කළැයි ගුරු සංගම් ක්‍රියාකාරිකයන් දෙදෙනෙකු අත්අඩංගුවට ගැනීම.

13. පා.ම. අනුර කුමාර දිසානායක ඇතුළු 26 දෙනෙකුට, කොළඹ ප්‍රදේශ කිහිපයකට ඇතුළු වීම තහනම් කරමින් අධිකරණ නියෝගයක් නිකුත් කිරීම.

14. උද්ඝෝෂණයක් විසුරුවාහැරීමට පොලිසිය එල්ල කළ කඳුළුගෑස් ප්‍රහාරයකට ලක් වීමෙන් උද්ඝෝෂකයකු ජීවිතක්ෂයට පත් වීම.

**1 වගුව: වාර්තා වූ සමස්ත සිදුවීම් - 2023 පෙබරවාරි**

| ආවරණය කර ඇති සංරචකය | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|
| ආරක්ෂාව සහ සුරක්ෂිතබව | 04 |
| නීතිමය කොන්දේසි | 09 |
| වෘත්තීයවේදිත්වය | 01 |
| **එකතුව** | **14** |

## ආරක්ෂාව සහ සුරක්ෂිතබව

**මාධ්‍යවේදීන්ට තම වෘත්තිය ශාරීරික සහ මානසික ඒකාග්‍රතාවකින් යුක්තව නිදහස් ලෙස කර ගෙන යෑමේ වාතාවරණයක් පැවතීම ජනමාධ්‍ය නිදහස පිළිබඳ මූලික කොන්දේසියකි. එමෙන්ම ජනමාධ්‍ය නිදහස හා අදහස් පළ කිරීමේ නිදහස ආරක්ෂා වීමට නම්, පුරවැසියන්ට අනිටු ප්‍රතිවිපාකවලට මුහුණදීමේ අවදානමකින් තොරව ජනමාධ්‍ය ඔස්සේ හෝ වෙනත් ආකාරවලින් නිදහසේ අදහස් පළ කළ හැකි වාතාවරණයක් පැවතිය යුතුය. සාමාකාමීව රැස්වීමේ, විරෝධය පළ කිරීමේ හා උද්ඝෝෂණවල නිරත වීමේ නිදහසද අදහස් පළ කිරීමේ නිදහසට අයත් වේ. මෙම මූලික නිදහස උල්ලංඝනය වූ අවස්ථා 04ක් පෙබරවාරි මාසයේදී නිරීක්ෂණය විය. උද්ඝෝෂණයකට එල්ල කළ කඳුළුගෑස් ප්‍රහාරයකින් එක් අයකු ජීවිතක්ෂයට පත්ව තවත් අයකු අසාධ්‍ය තත්ත්වයට පත් වීම ඒ අතරින් ඉතා බරපතළ සිදුවීමකි.**

**2 වගුව: 2023 පෙබරවාරි : ආරක්ෂාව සහ සුරක්ෂිතබව - සිදුවීම් 04**

| දර්ශකය | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|
| ජීවිත හානි / ඝාතන | 01 |
| පහරදීම් | 01 |
| මානසික බලපෑම් | 02 |
| **එකතුව** | **04** |

01. **එල්පින්ස්ටන් රඟහල අසල පැවති නිදහස සත්‍යග්‍රහයට පොලිසිය පහරදී විසුරුවාහැරීම.**

අධික විදයමක් දරා නිදහස් උලෙළක් පැවැත්වීමට එරෙහිව සිවිල් ක්‍රියාකාරිකයින් පිරිසක් විසින් පෙබ. 3 වැනිදා මෙම සත්‍යග්‍රහය ආරම්භ කෙරිණි. එදින රාත්‍රියේ මැර පිරිසක් කඩාවැදී එය කඩාකප්පල් කිරීම දැරූ උත්සාහයකින් අනතුරුව, පොලිසිය සත්‍යග්‍රහයේ යෙදුණු පිරිසට පහරදී, කඳුළුගෑස් හා ජල ප්‍රහාර එල්ල කොට එය

විසුරුවාහැරීමට ක්‍රියා කළේය. පොලිසියේ ක්‍රියාකලාපය නීතිඥවරුන් ඇතුළු සිවිල් ක්‍රියාකාරිකයන්ගේ දැඩි විවේචනයට ලක් විය. මෙහිදී ක්‍රියාකාරිකයින් සිව් දෙනෙකු පොලිසිය විසින් අත්අඩංගුවට ගැනිණි.

මූලාශ්‍රය: [www.youtube.com](http://www.youtube.com)

02. **උද්ඝෝෂණවලට සහභාගී වීම වැළැක්වීම සඳහා පොලිසිය තමන්ට එරෙහිව කුමන්ත්‍රණකාරීව කටයුතු කරන බවට අතුරුදන්වූවන්ගේ ඥාතීන්ගේ සංගමයේ සභාපති මාරියුසුරේස් ඊශ්වරී මානව හිමිකම් කොමිසමට පැමිණිලි කිරීම.**

විරෝධතාවලට සහභාගී නොවන ලෙස පොලිසිය තමන්ට දිගින් දිගටම බලපෑම් කරමින් සිටින බවත්, නිදහස් දිනය ආශ්‍රිතව පෙබ. 6 වැනිදා පැවති විරෝධතාවකට තමන් සහභාගී වී සිටියදී තම පුත්‍රයා ව්‍යාජ චෝදනාවක් මත අත්අඩංගුවට ගැනීමට පොලිසිය කුමන්ත්‍රණය කළ බවත් ඇය ප්‍රකාශ කරයි. තම ආරක්ෂාව තහවුරු කරන ලෙස ඇය මානව හිමිකම් කොමිසමෙන් හා ජාත්‍යන්තර මානව හිමිකම් ආරක්ෂකයින්ගෙන් ඉල්ලා සිටී.

මූලාශ: [www.youtube.com](http://www.youtube.com)

03. **අධ්‍යාපන අමාත්‍යාංශය තුළදී පොලිසිය සිසුන්ට පහරදෙන අයුරු වීඩියෝගත කළැයි ගුරු සංගම් ක්‍රියාකාරිකයන් දෙදෙනෙකු අත්අඩංගුවට ගැනීම.**

පෙබරවාරි 23 වැනිදා පාලි හා බෞද්ධ විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය භික්ෂූන් ඇතුළු පිරිසක් බත්තරමුල්ල අධ්‍යාපන අමාත්‍යාංශය තුළ සත්‍යග්‍රහයක නිරතව සිටියදී පොලිසිය ඔවුන්ට පහරදී පලවාහරින ආකාරය ජංගම දුරකථනවලින් වීඩියෝගත කරමින් සිටියදී මෙම ක්‍රියාකාරිකයින් අත්අඩංගුවට ගෙන තිබේ.

සමිත් හර්ෂනාත් සහ නාලක ද සිල්වා යන ක්‍රියාකාරිකයින් මෙම අවස්ථාවට මුහුණ පා ඇත්තේ විදින අධ්‍යාපන අමාත්‍යාංශ නිලධාරීන් සමඟ පැවති ස්ථාන මාරු මණ්ඩල රැස්වීමකට සහභාගී වී සිටියදීය. තලංගම පොලිසියට රැගෙන ගොස් ප්‍රශ්න කිරීමෙන් අනතුරුව ඔවුන් නිදහස් කෙරිණි.

මූලාශ්‍රය: [vivaranews.com](http://vivaranews.com)

04. **උද්ඝෝෂණයක් විසුරුවාහැරීමට පොලිසිය එල්ල කළ කඳුළුගෑස් ප්‍රහාරයකට ලක් වීමෙන් උද්ඝෝෂකයකු ජීවිතක්ෂයට පත් වීම.**

පෙබරවාරි 26 වැනිදා ජාතික ජන බලවේගය විසින් පවත්වන ලද ආණ්ඩු විරෝධී උද්ඝෝෂණයක් අතරතුර පොලිස් කඳුළු ගෑස් ප්‍රහාරයකට ලක්වීමෙන් පසු කොළඹ ජාතික රෝහලේ දැඩි සත්කාර ඒකකයේ ප්‍රතිකාර ලබමින් සිටියදී නිවිතිගල පදිංචිකරුවකු වූ නිමල් අමරසිරි (61) ජීවිතක්ෂයට පත් විය.

මෙම ප්‍රහාරයට ලක් වූ කැස්බෑව පදිංචි අජිත් ගමගේ (46) අසාධ්‍ය තත්ත්වයෙන් කොළඹ ජාතික රෝහලේ දැඩි සත්කාර ඒකකයට ඇතුළත් කෙරුණු අතර තවත් 28 දෙනෙකුට පොලිස් ප්‍රහාරවලින් තුවාල සිදු විය.

මූලාශ්‍රය: [lankatruth.com](http://lankatruth.com)

## නීතිමය කොන්දේසි

**මාධ්‍ය නිදහසට අදාළව නීතිමය කොන්දේසි පිළිබඳ සංරචකය යටතට ගැනෙන සිදුවීම් 09ක් පෙබරවාරි මාසය තුළ නිරීක්ෂණය විය. භාෂණයේ හා ප්‍රකාශනයේ නිදහසට එරෙහිව පොලිසිය නිරන්තරයෙන් ක්‍රියාත්මක වීම ඒ අතරින් කැපී පෙනෙයි. සියලු ආකාරවල උද්ඝෝෂණවලට එරෙහිව පොලිසිය අධිකරණයෙන් තහනම් නියෝග ඉල්ලා සිටීමේ ප්‍රවණතාවක් පසුගිය මාස කිහිපය තුළ මෙන්ම පෙබරවාරි මාසයේදීද නිරීක්ෂණය විය. පෙබරවාරි වාර්තාවට ඇතුළත් සිදුවීම්වලදී පොලිසිය උද්ඝෝෂකයින් 86 දෙනෙකු අත්අඩංගුවට ගෙන, එයින් 84 දෙනෙකු අධිකරණය වෙත ඉදිරිපත් කර තිබේ. ඉන් 62 දෙනෙකු රක්ෂිත බන්ධනාගාගත කෙරුණු අතර 22 දෙනෙකුට ඇප නියම විය.**

**3 වගුව: 2023 පෙබරවාරි: නීතිමය කොන්දේසි - සිදුවීම් 09**

| දර්ශකය | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|
| නීතිමය ක්‍රියාමාර්ග | 09 |
| **එකතුව** | **09** |

01. **නම් කළ ක්‍රියාකාරිකයින් පිරිසකට ජාතික නිදහස් උත්සවය පැවැත්වෙන ප්‍රදේශයට ඇතුළුවීම තහනම් කරමින් අධිකරණ නියෝගයක් නිකුත් කිරීම.**

කොටුව පොලිසිය කළ ඉල්ලීමක් අනුව කොළඹ කොටුව මහේස්ත්‍රාත් අධිකරණය මගින් පෙබ. 3 වැනිදා මෙම නියෝගය නිකුත් කෙරිණි. අන්තර් විශ්වවිද්‍යාලයීය

ශිෂ්‍ය බල මණ්ඩලයේ කැඳවුම්කරු වසන්ත මුදලිගේ, ලංකා ගුරු සංගමයේ ප්‍රධාන ලේකම් ජෝසප් ස්ටාලින්, ජීවන්ත පීරිස් පියතුමා, නීතිඥ නුවන් බෝපගේ ඇතුළු 29 දෙනෙකුට ජාතික නිදහස් උත්සවය පැවැත්වෙන පෙබරවාරි 4 වැනිදා ගාලුමුවදොර පිටිය හා ඒ අවට මාර්ග කිහිපයකට ඇතුළුවීම එමගින් තහනම් කොට ඇත.

මූලාශ්‍රය: www.youtube.com

02. **නිදහස සත්‍යග්‍රහයේදී අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කළ ක්‍රියාකාරිකයින් සිව් දෙනෙකුට ඇප නියම වීම.**

මහජන පීඩාවක් වන පරිදි හා මංමාවත් පනත උල්ලංඝනය කරමින් නීති විරෝධී අන්දමින් සත්‍යග්‍රහයක නිරත වීම ඇතුළු චෝදනා යටතේ මරදාන පොලිසිය විසින් සමාජමාධ්‍ය ක්‍රියාකාරික ප්‍රියත් නිකේෂල ඇතුළු මෙම සිව් දෙනාට එරෙහිව මාලිගාකන්ද මහේස්ත්‍රාත් අධිකරණයට කරුණු වාර්තා කොට තිබිණි. රුපියල් ලක්ෂය බැගින් වූ පුද්ගලික ඇප බැඳුම්කර මත ඔවුන් මුදාහැරීමට මහෙස්ත්‍රාත්වරිය නියෝග කළාය. සත්‍යග්‍රහයට පහරදීමට පැමිණි තිදෙනෙකුට එරෙහිව, 'කලහකාරිව හැසිරීම' ඇතුළු තවත් චෝදනා සම්බන්ධයෙන් පවරා තිබූ තවත් නඩුවක විත්තිකරුවන් ලෙස ඉහත ක්‍රියාකාරිකයින්ගෙන් තිදෙනෙකුද නම් කර තිබූ නමුත්, ඔවුන් එම චෝදනාවෙන් නිදහස් කෙරිණි.

මූලාශ්‍රය: divaina.lk

03. **අන්තර් විශ්වවිද්‍යාල ශිෂ්‍ය බල මණ්ඩලයේ කැඳවුම්කරු වසන්ත මුදලිගේ නිදහස් කිරීමට එරෙහිව අභියාචනයක් ඉදිරිපත් කිරීමට පොලිසිය තීරණය කිරීම.**

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ දීර්ඝ කාලයක් රඳවාගෙන සිටි වසන්ත මුදලිගේ සියලු චෝදනාවලින් නිදහස් කිරීමට ඉකුත් ජනවාරි 31 වැනිදා කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත්වරයා ලබා දුන් තීන්දුවට එරෙහිව කොළඹ මහාධිකරණය හමුවේ මෙම අභියාචනය ගොනු කිරීමට නියමිතය. ඒ සඳහා ඉල්ලීමක් නීතිපතිවරයා වෙත ඉදිරිපත් කළ බවත් පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා පෙබ. 02 වැනිදා නිවේදනය කළේය.

මූලාශ්‍රය: www.aruna.lk

04. **කැලණිය විශ්වවිද්‍යාලයේ සිසු නායකයින්ට එරෙහිව පොලිසිය ඉදිරිපත් කර ඇති චෝදනා පදනම් විරහිත බව විශ්වවිද්‍යාල පාලන අධිකාරිය අධිකරණයට දැනුම් දීම.**

කැලණිය විශ්ව විද්‍යාලයේ මහා ශිෂ්‍ය සංගමයේ සභාපති කැළුම් මුදන්නායක සහ ඩිල්ෂාන් හර්ෂණ යන ශිෂ්‍ය ක්‍රියාකාරිකයින්ට එරෙහිව නවකවදය සම්බන්ධයෙන් පොලිසිය නගා ඇති චෝදනා පදනම් විරහිත බව විශ්වවිද්‍යාල පාලනාධිකාරිය, එම සිසුන්ගේ නීතිඥවරුන් මාර්ගයෙන් අධිකරණයට දැනුම් දී තිබේ. මෙම චෝදනාව මත ඔවුන් ජනවාරි මාසයේ සිට රිමාන්ඩ් භාරයේ පසු වූ අතර, පෙබරවාරි 13 වැනිදා මහර අංක එක මහේස්ත්‍රාත් අධිකරණයේදී එම නඩුව කැඳවූ අවස්ථාවේ නීතිඥවරු මෙම කරුණ අධිකරණයට දැනුම් දුන්හ. පෙබරවාරි 20 වැනිදා දක්වා ඔවුන් යළි රක්ෂිත බන්ධනාගාරගත කරන ලෙස මහේස්ත්‍රාත්වරිය නියෝග කළාය.

මූලාශ්‍රය: mawbima.lk

05. **ජනපතිගේ යාපනය සංචාරයට එරෙහිව උද්ඝෝෂණයක නිරත වූ පා.ම. ගජේන්ද්‍රන් ඇතුළු විරෝධතාකරුවන් 18 දෙනෙකු අත්අඩංගුවට ගැනීම.**

දෙමළ ජාතික ජනතා පක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රී සෙල්වරාජා කජේන්ද්‍රන්, ලංකා ගුරු සංගමයේ යාපනය දිස්ත්‍රික් සංවිධායක තීපන් තිලීෂන් ඇතුළු 18 දෙනෙකු, පෙබරවාරි 11 වැනිදා යාපනය බස් නැවතුම්පොළ ඉදිරිපිට පැවති උද්ඝෝෂණය අතරතුරදී මෙලෙස අත්අඩංගුවට ගෙන ඇත. අධි ආරක්ෂක කලාපයකට ඇතුළු වීම සහ අධිකරණ නියෝගයක් කඩ කිරීම යන චෝදනා මත ඔවුන් එදින රාත්‍රියේ යාපනය වැඩබලන මහේස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව රු. ලක්ෂ 3 බැගින් වූ ශරීර ඇප මත මුදාහැරිණි.

මූලාශ්‍රය: www.adaderana.lk

06. **පුවත් වෙබ් අඩවි ලියාපදිංචිය සම්බන්ධයෙන් මානව හිමිකම් කොමිසම නිර්දේශයක් නිකුත් කිරීම.**

පුවත් වෙබ් අඩවි ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් වඩාත් විනිවිදභාවයෙන් යුත් නීත්‍යානුකූල ක්‍රමවේදයක් සකස් කොට ඉදිරිපත් කරන ලෙස, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසන් සභාව ජනමාධ්‍ය අමාත්‍යාංශයට නිර්දේශ කර ඇත.

ආරක්ෂක අමාත්‍යාංශයේ නිෂ්කාශනය නොලැබුණු බව පවසමින් medialk.com වෙබ් අඩවිය ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධයෙන් එහි ප්‍රධාන සංස්කාරක තරිඳු ජයවර්ධන විසින් ජනමාධ්‍ය අමාත්‍යාංශයට එරෙහිව ඉදිරිපත් කරන ලද පැමිණිල්ලක් විභාග කිරීමෙන් අනතුරුව මානව හිමිකම් කොමිෂන් සභාව මෙම නිර්දේශ ඉදිරිපත් කර තිබේ.

මූලාශ්‍රය: theleader.lk

07. **සමගි ජන බලවේගය විසින් කැඳවන ලද උද්ඝෝෂණයකට අදාළව අධිකරණයෙන් තහනම් නියෝගයක් නිකුත් කිරීම.**

පෙබරවාරි 20 වැනිදින සමගි ජන බලවේගය විසින් කොළඹදී පැවැත්වූ උද්ඝෝෂණයකට අදාළව කොටුව පොලිස්ථානය විසින් කරන ලද ඉල්ලීමකට අනුව කොටුව මහේස්ත්‍රාත්වරයා විසින් මෙම තහනම් නියෝගය නිකුත් කෙරිණි. ඒ අනුව, නම් කළ වගඋත්තරකරුවන් 7 දෙනෙකු හා ඔවුන් සමග පැමිණෙන පිරිසට ජනාධිපති කාර්යාලය, ජනාධිපති මන්දිරය, මුදල් අමාත්‍යාංශය සහ

ගාලු මුවදොර පිටිය පරිශ්‍රය යන ස්ථානවලට ඇතුළුවීම තහනම් කර තිබේ.

මූලාශ්‍රය: colombotimes.lk

08. **අධ්‍යාපන අමාත්‍යාංශයට බලහත්කාරයෙන් ඇතුළු වීමේ චෝදනාව මත අත්අඩංගුවට ගත් ශිෂ්‍ය භික්ෂූන් ඇතුළු සරසවි සිසුන් 62 දෙනෙකු බන්ධනාගාරගත කිරීම.**

පෙබරවාරි 23 වැනිදා බත්තරමුල්ලේ අධ්‍යාපන අමාත්‍යාංශය තුළ සත්‍යග්‍රහයක නිරතව සිටියදී අත්අඩංගුවට ගත් අවිශිබම කැඳවුම්කරු වසන්ත මුදලිගේ සහ ශිෂ්‍ය භික්ෂූන් 53 දෙනෙකු ඇතුළු සරසවි සිසුන් 62 දෙනෙකු, කඩුවෙල මහේස්ත්‍රාත්වරයා හමුවට ඉදිරිපත් කිරීමෙන් පසුව පෙබරවාරි 27 වැනිදා දක්වා රක්ෂිත බන්ධනාගාරගත කෙරිණි.

අධ්‍යාපන අමාත්‍යාංශයට බලහත්කාරයෙන් ඇතුළු වීම, පොදු දේපළවලට හානි සිදු කිරීම, එහි රාජකාරි සිදුකල නිළධාරීන්ට බාධා සිදු කිරීම සහ අඩන්තේට්ටම් සිදු කිරීම, අයුතු ජන රාශිය සාපරාධී බිය ගැන්වීම, කුමන්ත්‍රණය යන චෝදනා තලංගම පොලිසිය මෙම සැකකරුවන්ට එරෙහිව ගොනු කර ඇත.

මූලාශ්‍රය: www.colomboxnews.com

09. **පා.ම. අනුර කුමාර දිසානායක ඇතුළු 26 දෙනෙකුට, කොළඹ ප්‍රදේශ කිහිපයකට ඇතුළු වීම තහනම් කරමින් අධිකරණ නියෝගයක් නිකුත් කිරීම.**

මැතිවරණය නොපැවැත්වීම, විදුලි ගාස්තු හා බදු ඉහළ නැංවීම ඇතුළු කරුණු කිහිපයකට විරෝධය පළ කරමින් ජාතික ජන බලවේගය පෙබරවාරි 26 වැනිදා කොළඹදී පැවැත්වූ විරෝධතාව පදනම් කර ගනිමින් කොටුව, කොම්පඤ්ඤවීදිය හා කොල්ලුපිටිය පොලිස් ස්ථානාධිපතිවරුන් කළ ඉල්ලීමකට අනුව කොටුව මහේස්ත්‍රාත්වරයා විසින් මෙම තහනම් නියෝගය නිකුත් කෙරිණි.

නම් කරන ලද පිරිසට, 26 වැනිදා පස්වරු 1 සිට රාත්‍රී 8 දක්වා ජනාධිපති මන්දිරය, ජනාධිපති ලේකම් කාර්යාලය, ගාලු මුවදොර ඇතුළු කොළඹ ප්‍රදේශ රැසකට ඇතුළුවීම එම නියෝගයෙන් තහනම් කොට තිබේ.

මූලාශ්‍රය: news19.lk

## වෘත්තීයවේදීත්වය

**වෘත්තීයවේදීත්වය යන සංරචකය යටතට, මාධ්‍යවේදීන්ගේ අධ්‍යාපනය හා පුහුණුව, මාධ්‍යවේදීන්ගේ සේවා කොන්දේසි, මාධ්‍යවේදීන් කර්තෘමණ්ඩල හා ජාත්‍යන්තර මාර්ගෝපදේශ භාවිතය, ස්වයං වාරණය, වෘත්තීය සමිති හා සංගම් මගින් මාධ්‍යවේදියාගේ ස්වාධිපත්‍යය, තමන්ගේ කාර්යභාරය පිළිබඳව මාධ්‍යවේදියාගේ අවබෝධය, මාධ්‍ය වෘත්තියට ඇති පිළිග ැනීම යන දර්ශක ඇතුළත් වේ. මෙම සංරචකය යටතට ගැනෙන එක් සිදුවීමක් පෙබරවාරි මාසයේදී වාර්තා විය.**

**4 වගුව: 2023 පෙබරවාරි: වෘත්තීයවේදීත්වය - සිදුවීම් 01**

| දර්ශකය | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|
| මාධ්‍යවේදීන්ගේ අධ්‍යාපනය සහ පුහුණුව | 01 |
| **එකතුව** | **01** |

1. **කොවිඩ් 19 කාලසීමාව තුළ ශ්‍රී ලංකා රජයේ විනිවිධභාවය හා වගවීම සම්බන්ධ විමර්ශනය කිරීම සඳහා මාධ්‍යවේදීන්ට පුහුණු වැඩසටහනක් පැවැත්වීම.**

නිදහස් මාධ්‍ය ව්‍යාපාරය මගින්, මෙම විෂය පිළිබඳ විමර්ශනාත්මක ලිපි සම්පාදනය කිරීම සඳහා තෝරාගත් මාධ්‍යවේදීන් පිරිසක් වෙනුවෙන් පෙබරවාරි 11 සහ 12 දිනවල ශ්‍රී ලංකා පුවත්පත් ආයතනයේදී මෙම වැඩමුළුව පැවැත්විණි.

මූලාශ්‍රය: www.facebook.com

**5 වගුව: මාධ්‍ය නිදහස: 2023 ජනවාරි-පෙබරවාරි දක්වා නිදහස් මාධ්‍ය ව්‍යාපාරය වෙත වාර්තා වී ඇති සිදුවීම්.**

| ආවරණය කර ඇති සංරචකය | 2023 ජනවාරි | | 2023 පෙබරවාරි |
|---|---|---|---|
| | නව සිදුවීම් | පෙර සිදුවීම්වල වර්ධනයන් | |
| ආරක්ෂාව හා සුරක්ෂිතබව | - | - | 04 |
| නීතිමය කොන්දේසි | 11 | 01 | 09 |
| මාධ්‍යයේ ස්වාධීත්වය | - | - | - |
| වෘත්තීයවේදීත්වය | - | - | 01 |
| ව්‍යුහාත්මක කොන්දේසි | 3 | - | - |
| **එකතුව** | **14** | **01** | **14** |

පසුගිය මාධ්‍ය නිදහස මාසික වාර්තා මෙතැනින් බලන්න

**පසුසටහන:** සිවිල් සමාජ අපේක්ෂාවන්, ජාතික හා ජාත්‍යන්තර නඩු තීන්දු සහ අන්තර්ජාතික ප්‍රඥප්තීන්ටද අනුව යමින්, මාධ්‍ය නිදහස යනු මානව අයිතියක් ලෙස නිදහස් මාධ්‍ය ව්‍යාපාරය පිළිගනියි. සෑම තැනැත්තකුම සතු සිතීමේ නිදහස, හෘදය සාක්ෂියේ නිදහස සහ ආගමික නිදහස මෙන්ම අන් තැනැත්තන්ගේ මත දැනගැනීමට තිබෙන මූලික අයිතිය බාධාවකින් තොරව භුක්තිවිඳීම මානව අයිතියකි. මෙම පදනම මත පිහිටා මාධ්‍ය නිදහස යනු පහත දැක්වෙන දසවැදෑරුම් සංඝටකවල එකතුවක් ලෙස නිදහස් මාධ්‍ය ව්‍යාපාරය සලකයි. (1) සිතීමේ නිදහස (2) මතයක් දැරීමේ නිදහස (3) භාෂණයේ නිදහස (4) සාමකාමීව රැස්වීමේ නිදහස ඇතුළු අදහස් පළ කිරීමේ නිදහස (5) තොරතුරු දැනගැනීමේ නිදහස (6) ශ්‍රව්‍ය, දෘශ්‍ය පටිගත කිරීමේ සහ වාර්තා තබා ගැනීමේ නිදහස (7) ප්‍රකාශනයේ නිදහස (8) පුවත්පත් නිදහස (9) විද්‍යුත් මාධ්‍ය නිදහස (10) අන්තර්ජාල නිදහස යනු එම සංඝටකයන්ය. මෙම සංඝටක අතර ඇත්තේ සහජීවී සම්බන්ධයක් වන අතර එක් සංඝටකයක ඇති වන සීමාවක් මාධ්‍ය නිදහස පිළිබඳ අනෙක් සියලුම සංඝටකයන් භුක්තිවිඳීමේ නිදහස අහුරන බව නිදහස් මාධ්‍ය ව්‍යාපාරය පිළිගනියි. එමෙන්ම වගකීම් විරහිතව හා වෛරී සහගත ලෙස එම නිදහස භාවිත කිරීම යහපත් භාවිතාවක් නොවන බවද නිදහස් මාධ්‍ය ව්‍යාපාරය අවධාරණය කරයි.

මෙම මාසික වාර්තා පිළියෙල කරනු ලබන්නේ ජනමාධ්‍ය වාර්තා සහ නිදහස් මාධ්‍ය ව්‍යාපාරයට ලබා ගත හැකි තොරතුරු අනුව වැඩිදුර තොරතුරු සොයා එම සිදුවීම් විශ්ලේෂණය කිරීමෙනි. මෙම විශ්ලේෂණයේදී නිදහස් මාධ්‍ය ව්‍යාපාරය ඉහත කී දසවැදෑරුම් මාධ්‍ය නිදහස් සංඝටකයන් ආවරණය කරන ජාත්‍යන්තරව පිළිගත් සංරචකයන් හතක් ඔස්සේ තෝරා ගත් නිර්ණායක භාවිත කරයි.


Free Media Movement

Convener: Lasantha De Silva +94 71 166 7938, +94 77 810 7620 | Secretary: Hana Ibrahim +94 77 741 2995
Treasurer: Ananda Jayasekara +94 77 312 4850
No 96, Bernard Soysa Mw, Colombo 05. Tel: +94 112368895 Fax: +94 112368895;
Web: www.fmmsrilanka.lk, www.mediareform.lk
Email: fmmsrilanka@gmail.com | Facebook: https://www.facebook.com/fmm.srilanka
Twitter: https://twitter.com/FMMsrilanka | #FMM25


Layout: Nalinda Seneviratne